විජය රජුගේ මරණයෙන් පසු,
ඉන්දියාවේ සිට පැමිණි
ඔහුගේ  සහෝදරයාගේ පුත්,
පණ්ඩුවාසුදේව රජ බවට පත් විය.
ඔහුගේ බිසව වූයේ භද්දකච්චානාය.



(c) Sumitha Publishers

මේ දෙපළට පුතුන් දස දෙනෙක්ද,
එක් දුවක්ද සිටියහ. වැඩිමහල් පුතු
අභය නම් වූ අතර දියණිය චිත්‍රා නම් වූවාය.

නැකත්කරුවන්ගේ අනාවැකිය වූයේ
චිත්‍රාට ලැබෙන පිරිමි දරුවා ඔහුගේ
මාමාවරුන් සියල්ලම මරා, රජ වන බවය.
මෙය දැනගත් පණ්ඩුවාසුදේව රජුගේ පුත්තු
කලබලයට පත්වූහ.



(c) Sumitha Publishers